# 2019 පෙබරවාරි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2019 පෙබරවාරි මස මාසික සභා රැස්වීම 2019.02.14 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2019.01.10 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ 5.1.(X) යෝජනාවේ ගරු සභාපතිතුමාගේ අදහස් දැක්වීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම සඳහන්ව නොමැති බවත් එය "වොලිබෝල් ක්‍රීඩා උපකරණ වලට අමතරව ක්‍රිකට් ක්‍රීඩා උපකරණද ලබා දීම සුදුසු බවත් ක්‍රිකට් හා වොලිබෝල් ක්‍රීඩා දෙක සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම සඳහා රු.100,000/= ක මුදල ප්‍රමාණවත් නොවන බැවින් රු.200,000/= ක මුදලක් ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලද අතර,ඒ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ඉල්ලා සිටි බැවින් එකී යෝජනාව විෂය භාර ගරු අමාත්‍යතුමාගේ /ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කිරීම සුදුසු බව සභාව විසින් ඒකමතිකව ස්ථිර කරන ලදී."යනුවෙන් සඳහන් විය යුතු බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව 2019.01.10 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. <u>ගරු සභාපතිතුමාගේ නිවේදන</u>

**2.1.** . පළාත් සංචාරක අමාත්‍යංශය මඟින් එවන ලද හෝටල් ක්ෂේත්‍රය පදනම් කරගනිමින් නොමිලේ පවත්වනු ලබන ත්‍රයිමාසික පාඨමාලාවන් පිළිබඳ දැනුවත් කල අතර ඒ සඳහා සුදුසුකම් ඇති සිසුන් සිටී නම් සම්බන්ධකරවන ලෙස ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

## 3. <u>සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම</u>

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

### 3.2. දීර්ඝ කාලීන බදු බලපත්‍ර යටතේ රජයේ ඉඩම් ලබා දීම සඳහා ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලබා ගැනීම

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එළමල්පේ වසමේ පිහිටි ගල්කොරටුවෙහේන නැමති ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර යටතේ ලබා ගැනීමට අවසර ඉල්ලා අංක WEDS/LND/7/LEASE/1/4/11 හා 2019.02.10 දිනැතිව එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**3.3. මැනුම් ගාස්තු දැනුම් දීම - මැනුම් ඉල්ලීම් අංක 193**

ඕපනායක ප්‍රාදේශීය ලේකම්තුමා විසින් උතුරු හුණුවල ,මල්මීකන්ද, මීගහවෙල යන ග්‍රාම නිලධාරී වසම් වල සිට දෙල්ගස්හන්දිය අසලින් රත්නපුර බලන්ගොඩ ප්‍රධන මාර්ගයට පිවිසෙන්නාවූ ගම්සභා මාර්ගයේ මාර්ග රක්ෂිතයට අයත් බිම් කොටස් මැනුම් කිරීමට අදාලව මැනුම් ඉල්ලීම් අංක 193 අදාල මැනුම් ගාස්තු වන රු.287500/= මුදල රත්නපුර - ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ගෙවන ලෙසට ඉල්ලීමක් කරමින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**3.4. ප්‍රජා ශාලා ගොඩනැගිල්ල සංවර්ධනය කර සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර ගැනීම සම්බන්ධවයි**

නිසසල පෙර පාසල් ප්‍රධාන පාලිකාව විසින් වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පෙර පාසල් සංවරධන වැඩසටහනට සඳගනාගම නිසසල පෙර පාසල තෝරාගෙන ඇති බැවින්,ඒ සඳහා අවසර ඉල්ලා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. <u>ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා</u>

I. 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම.

2018 වර්ෂයේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාව සතු සියළු ඉන්වෙන්ට්‍රි ගත භාණ්ඩ සමීක්ෂණය කර සකස් කරන ලද වාර්තාවට සභා අනුමැතිය ලබා දෙන ලෙසත්,

II. 2018.12.13 දින පැවති මාසික සභා රැස්වීමේ තීරණ අංක 5.1(VII) සංශෝධනය කිරීම.

කාර්යාල ගොඩනැගිල්ලේ II අධියර වැඩ කටයුතු ආරම්භ කිරීමත් සමඟ භාවිතයට නොගන්නා පැරණි ගොඩනැගිලි හා තාවකාලිකව ඉදිකරන ලද කසල මධ්‍යස්ථානය කඩා ඉවත් කිරීමටත්,ඉදිකිරීමට අවහිර වන සේ පිහිටි ගස් කපා ඉවත් කිරීමටත් සභා අනුමැතිය ලබා දෙන ලෙසට සංශෝධනය කිරීම අවශ්‍ය බවත්,

III. අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීම

- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම ,අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල බත් කඩ,ආපනශාලා, තේ හෝ කොපි කඩ, පවත්වාගෙන යාම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

- පුස්තකාල කටයුතු විදිමත් කිරීම පිලිබඳ අතුරු ව්‍යවස්ථාව
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ඉහතින් දක්වා ඇති අතුරු ව්‍යවස්ථා සඳහා සභා අනුමැතිය අවශ්‍ය බවත්,

IV. කාර්යාල භූමියේ කපා ඉවත් කර ඇති ගස් වෙන්දේසි කිරීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත්, ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද I සිට IV දක්වා වූ යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

V. වැලිගෙපොල ඉදිකිරීමට නියමිත නව වෙළඳ සංකීර්ණය හා සති පොල සඳහා සැලසුම් සකස් කිරීමට හා දැනට ඉදිකර ඇති සියළු ඉදිකිරීම් ගලවා ඉවත් කිරීම අවශ්‍ය බවත්

VI. පුස්තකාලය ස්ථාපිත කිරීම සඳහා ICT ආයතනය මඟින් ලබා දෙන නිර්ණායක අනුව තීන්ත ආලේප කිරීම හා අවහිරවන දෑ ගලවා ඉවත් කිරීම අවශ්‍ය බවත්,

VII. ඕපනායක පොල භූමියට ඇතුළුවීමට ගේට්ටුවක් සකස් කිරීම,වැට ඉදිකිරීම හා මාළු විකිණීම සඳහා ස්ථානයක් සකස් කිරීම සුදුසු බවත්,

VIII. ඕපනායක පැරණි ආහාර ගබඩාව සතුව ඇති ළිඳ පිළිසකර කර ප්‍රදේශයේ ජනතාවට පානීය ජල පහසුකම් හා ස්නානය කිරීමේ පහසුකම් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බැවින් ජල මෝටර් දෙකක් සවි කිරීම අවශ්‍ය බවත්,

IX.

| | | |
|---|---|---|
| 2019 වර්ෂයේ පැළ රෝපනයට (ඖෂධ,පළතුරු,වෙනත්) | - | 200,000.00 |
| වීථි පහන් 100ක් මිලදී ගැනීම | - | 300,000.00 |
| හියුම් පයිප්ප මිලදී ගැනීම | - | 1,000,000.00 |
| කොට්ඨාශ 2 ට ක්‍රීඩා පිටි 2 ක් සංවර්ධනය | - | 1,000,000.00 |
| කර්මාන්ත සඳහා | - | 2,500,000.00 |
| | | 50,000,000.00 |

අමතරව ලද මුදල් ඉහත ව්‍යාපෘති සඳහා යෙදවීම සුදුසු බවත්,

X. නව ගොඩනැගිල්ල ඉදි කිරීමත් සමඟ ප්‍රවේශ මාර්ගය වෙනස් කිරීමට සිදුවන බැවින් ඉදිරි පස ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,

XI. කාර්යාලයේ හා පුස්තකාලයේ භාවිතය සඳහා පවතින SLT ස්වයංක්‍රීය මෘදුකාංගය දෝෂ සහිත බැවින් එය ඉවත් කර ඩයලොග් 4G සබධතාවක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

XII. නැණසල මධ්‍යස්ථානය ප්‍රාදේශීය සභාවට පවරාගෙන එහි සේවය කරන ඩී.බුද්ධිකා ප්‍රියදර්ශනී මෙනවිය වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරේ ස්ථාපිත කිරීම සුදුසු බවත්,

XIII. සභාව සතු RD 7987 අංක දරණ ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම හා,

XIV. සභාව සතු RD 9402 අංක දරණ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම අවශ්‍ය බවත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමාගේ V සිට XIV දක්වා වූ යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත V වෙනි හා XI වෙනි යෝජනා සම්බන්ධයෙන් කරුණු විමසමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා වැලිගෙපොල නගර මධ්‍යයේ දැනට ඉදිකර ඇති ගොඩනැගිලි කඩා ඉවවත් කරන්නේ නම් නව ගොඩනැගිල්ල කඩිනමින් ඉදිකල හැකිද යන්නත්,SLT ස්වාංක්‍රිය මෘදුකාංගය හා ඩයලොග් 4G සම්බන්ධතාව සැසඳීමක් කර ලබා ගැනීමට කටයුතු කරන්නේද යන්නත් විමසා සිටියේය.එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා ගොඩනැගිල්ල ඉදිකිරීමට සැළසුම් සකස්කර ටෙන්ඩර් කල පසු පවතින ගොඩනැගිලි ඉවත් කිරීමට කටයුතු කරන බවත්, පළාත් සභාවට අනුයුක්ත බළන්ගොඩ නගර සභාවේ සේවය කරන තොරතුරු තාක්ෂණික නිලධාරි හරහා පරීක්ෂා කර මෙම තීරණය ගන්නා බවත්, ප්‍රකාශ කලේ ය.ගරු සභාපතිතුමාගේ XII වෙනි යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා ,නැණසල මධ්‍යස්ථානය සභාවට පවරා ගැනීම අනවශ්‍ය වගකීමකට සභාව බැදීමක් බව පෙන්වා දෙන ලදී.එයට අදහස් එක්කල ගරු සභාපතිතුමා ,නැණසලට ලැබෙන ආදායම මත එහි භාරකරුට වැටුප් ගෙවන බවත්,මේ වන විට නැණසලට විශාල සිසුන් පිරිසක් පැමිණෙන නමුත් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකිරීමට ප්‍රමාණවත් උපකරණ නොමැති වීම හා ඉඩ පහසුකම් සීමිත වීම පෙන්වා දුන් අතර,නැණසල සභාවට පවරා ගන්නේනම් අවශ්‍ය උපකරණ සහා අරමුදලින් ලබා දී එහි ආදායම වැඩිකර සභාවට ලබා ගත හැකි බව පැහැදිලි කරන ලදී . ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහන විජේරත්න මැතිතුමා අදහස් දක්වමින්, ඕපනායක ආහාර ගබඩාව පවරාගෙන පාසල අවට වාහන තදබදය නැති කිරීමට කටයුතු කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට සිය ස්තූතිය පල කලේය.ඒ අනුව ගරු සභාපතිතුමාගේ අංක V සිට XIV දක්වා වූ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා ලෙස පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.**

XV. 2019 වසරේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත්

XVI. ඉදිකිරීමට යෝජිත හෙළ බොජුන්හලට පළපුරුදු කාන්තා පිරිසක් එක් කර කාන්තා සංවිධානයක් බිහිකර ඔවුන් පුහුණු කිරීම අවශ්‍ය බවත්,

XVII. බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේදී සහා අනුමැතියකින් තොරව කට්ටි කර විකුණන ලද හෙක්ටයාර් 01 ට අඩු ඉඩම් කට්ටි සඳහා තමාට අයත් කොටස පමණක් සභාවේ කොන්දේසි හා නියමයන්ට යටත්ව අදාල ගාස්තු ගෙවීමෙන් සභාවේ අනුමත කිරීමට සභාවේ එකගතාව ලබා දෙන ලෙසත්,

XVIII. බල ප්‍රදේශය තුල පවතින රාජ්‍ය ආයතන වල සියළු ඉදිකිරීම් හා බිම් සැළසුම් සඳහා සභාවේ සැලසුම් කමිටු අනුමැතිය ලබා ගත යුතු බවට රාජ්‍ය ආයතන දැනුවත් කිරීම අවශ්‍ය බවත්,

XIX. සෑම මසකම සභාවේ පෙර පෝය වැඩසටහන් සංවිධානය කිරීමට සභා අනුමැතිය අවශ්‍ය බවත්,

XX. පනාන කොට්ඨාශයේ පල්ලන්ද බහුකාර්ය ගොඩනැගිල්ලේ 250000/=ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය අවශ්‍ය බවත්,

XXI. රජයෙන් ලබා දී ඇති කම්පෙක්ටර් යන්ත්‍රයේ සේවකයින්ට යාම සඳහා පා පුවරු සවිකිරීම,කැමරා සවි කිරීම,අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම සුදුසු බවත්,

XXII. පුස්සතොට සමෘද්ධි ප්‍රජාමූල බැංකුව සඳහා සභාව සතු ඉඩමෙන් කොටසක් ඉල්ලා ඇති බවත්, යෝජනාකරන ලදී.

ගරු සභාපතිතුමාගේ XV සිට XXII දක්වා වූ යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී අචිනි එස් .අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත හදිසි යෝජනා සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.කේ.ඉසුරුමුණි මැතිතුමා ,කට්ටි කරන ලද බිම් කොටස් අනුමත කිරීමේ දී පැන නැඟිය හැකි නීතිමය ගැටළු පිළිබඳ සවිස්තරාත්මකව කරුණු පැහැදිලි කිරීමක් කරන ලද අතර 2019 වසරේ පැළ රෝපනයට ලක්ෂ 2 ක මුදලක් වෙන් කිරීම අගය කරන ලදී,තම අදහස් එක්කල ගරු සභාපතිතුමා ,ජනතාවගේ අසීරුතා සැලකිල්ලට ගෙන හෙක්ටයාර එකට අඩු කට්ටි කල කොටස් සඳහා සභාවේ කාර්මික නිලධාරීතුමාගේ උපදෙස් ,කොන්දේසි හා නියමයන්ට යටත්ව අනුමත කිරීමට කටයුතු සිදු කරන බව පැවසීය.

ගරු සභාපතිතුමාගේ XXII යෝජනාවට ගරු මන්ත්‍රීතුමන්ලා සියළුදෙනා විරුද්ධත්වය ප්‍රකාශ කල අතර සියළු දෙනාගේ මතය වූයේ ප්‍රාදේශීය සභාව සතු එම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකර එය බදු දීමෙන් සභාවට ආදායමක් උපයා ගත හැකි , එම ඉඩම සභාව සතුව තබා ගැනීම සුදුසු බවයි.ඒ අනුව ගරු සභාපතිතුමාගේ XXII යෝජනාව හැර XV සිට XXI දක්වා යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

XXIII. ජාතීන් අතර සහයෝගීතාව ඇතිකිරීමත් ,සංස්කෘතීන් සිහිගැන්වීමේ අරමුණැතිව සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයක් සංවිධානය කිරීම සුදුසු බවත්,ඒ සඳහා සභා අරමුදලින් රුපියල් 200000/=ක මුදලක් අවශ්‍ය බවත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.මෙහි දී අදහස් දැක්වූ ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී රණතුංග මැතිතුමා ඇතුළු වැලිගෙපොල ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමන්ලා ,මන්ත්‍රීතුමියන්ලා විසින් වැලිගෙපොල කොට්ඨාශය කේන්ද්‍ර කරගෙන අවුරුදු උත්සවය පවත්වන ලෙස ඉල්ලා සිටින ලදී.මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා හල්ලින්න උතුරු හුණුවල, දාන්දාව වැනි ප්‍රදේශ වල දෙමළ ජනතාව වැඩි වශයෙන් සිටින බැවින් ඔවුන් මේ සඳහා සම්බන්ධ කර ගැනීමේ පහසුව පිණිස ඕපනායක කේන්ද්‍ර කර ගත් බවත් ,වැලිගෙපොල කොට්ඨාශයට අයත් වතු ආශ්‍රිත අකරුල්ල හා පනාන දෙමළ ජනතාවට සහභාගීවීමට ප්‍රවාහන පහසුකම් සැලසිය හැකි බව ප්‍රකාශ කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමාගේ XXIII යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය</u>

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. කෝන්ගස්තැන්න ශ්‍රී විජයාරාමයට පිවිසෙන මාර්ගයේ වීථි ලාම්පුවක් සවි කිරීම අවශ්‍ය බවත්,
II. කෝන්ගස්තැන්න කීරපද්දෙනිය බස් මගී ආවරණය ඉතා අබලන් තත්වයක ඇති බැවින් එය පිළිසකර කර දෙන ලෙසත්,
III. ඉළුක්කුඹුර බෙහෙත් කාමරය අසලින් යන මාර්ගය පුළුල් කර ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්ලිව්.ඒ.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.තම යෝජනා සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කලේ කෝන්ගස්තැන්න ශ්‍රී විජයාරාමයේ ඉදිරියේදී පිංකම් මාලාවක් පැවැත්වීමට නියමිත බැවින් වීථි පහනක් සවි කිරීම අත්‍යාවශ්‍ය බවත්,ඉළුක්කුඹුර බෙහෙත් කාමරය අසලින් යන මාර්ගයේ ආරම්භක ස්ථානය පුළුල් කිරීම අවශ්‍ය නමුත් ඉඩම් අයිතිකරුවන් විරුද්ධ බැවින් ඒ සඳහා සභාව මැදිහත් වී මාර්ගය පුළුල් කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.ඒ අනුව ගරු මන්ත්‍රීතුමියගේ යෝජනා සියල්ල ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්ලිව්.ඒ.සුමනාවතී මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින්,

I. තැන්නහේන සුසානභූමිය අසල සිට ජේ.අජිත් කුමාර මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බවත්,
II. එච්.ඒ.ගාමිණී මහතාගේ නිවස අසල සිට නිරෝෂා මහත්මියගේ නිවස දක්වා ඇති මාර්ගය මැන වෙන්කර ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මුත්තෙට්ටුපොල ආන්ගිරිහෙල මාර්ගය කැපීමට JCB යන්ත්‍රය ලබා ගැනීම අවශ්‍ය බවත්,
II. මඩවලලන්ද පහල අස්වැද්දුම වෙල් යායට ඇති මාර්ගය බොරළු දමා සකස් කිරීම අවශ්‍ය බවත්,
III. ගල්පාය ලයිට් පාරේ සිට ජයන්ත මහතාගේ නිවස දක්වා මාර්ගය බොරළු දමා සකස් කිරීම අවශ්‍ය බවත්,
IV. පුස්සතොට ගඟබඩ මාර්ගය බොරළු දමා සකස් කිරීම අවශ්‍ය බවත්,
V. බඹරගල කන්ද විහාරයට යන මාර්ගය කැපීමට JCB යන්ත්‍රය ලබා ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 5.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් පහත යෝජනා ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

I. අකරල්ල වොලිබෝල් ක්‍රීඩා පිටියේ රාත්‍රී ක්‍රීඩා කිරීමට විදුලි ආලෝකය ලබා ගැනීම අවශ්‍ය බවත්,
II. වල්ලකැටිය වසමේ කන්දඋඩ කඩේ අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
III. ලියනගොඩ විසම්බරාගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තම පළමු යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා සඳහන් කලේ අකරුල්ල වොලිබෝල් ක්‍රීඩා කණ්ඩායම දිස්ත්‍රික් මට්ටමේ ශූරතාද ලබාගෙන ඇති දක්ෂ කණ්ඩායමක් බවත්,ආර්ථික දුෂ්කරතා හේතුවෙන් රැකියා කටයුතු වල නිරත වෙන බැවින් පුහුණු කටයුතු සඳහා රාත්‍රී කාලය යොදා ගැනීම අවශ්‍ය වන අතර ඒ සඳහා විදුලිය ලබා ගැනීම අවශ්‍ය බවයි.ඒ අනුව ගරු මන්ත්‍රීතුමාගේ සියළු යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 5.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

i. මොරවිටිවල සිට මල්මීකන්ද දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
ii. මල්මීකන්ද තලාව මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
iii. හුණුවල නො. 01 කොටස ඇති වතු මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
iv. හුණුවල නව ගම්මානයේ කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටරය යෙදවීම සුදුසු බවත්,
v. හුණුවල නව ගම්මාන මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කරීම සුදුසු බවත්,
vi. මිදැල්ලදෙනිය දීලානන්ද රත්නායක මහතාගේ නිවසට යන මාර්ගය පස් කපා සංවර්ධනය කිරීම සුදුසු බවත්,
vii. මල්මීකන්ද තලාව මාර්ගයේ ධර්මදාස මහතාගේ නිවසට යන මාර්ගය පස් කපා සංවර්ධනය කිරීම සුදුසු බවත්,
viii. ප්‍රාදේශීය සභාවේ ආපනශාලාවක් ආරම්භ කිරීම සුදුසු බවත්,
ix. අළුදෙනිය සේන මහතාගේ නවස අසලට වීථි පහනක් සවි කිරීම සුදුසු බවත්,
x. පහලවෙල මාර්ගයේ ගං ඉවුර සේදී ඇති ස්ථාන අවදානම් නිසා එම ස්ථාන වලට වීථි පහන් සවි කිරීම සුදුසු බවත්,
xi. දෙල්ගස්හංදිය කහවත්ත මාර්ගයේ ලෙන්දර ප්‍රදේශයේ අවදානම් ස්ථාන වලට වීථි පහන් සවි කිරීම සුදුසු බවත්,
xii. මල්මීකන්ද වහුම්පුරකන්ද සමන්ත මහතාගේ නවස අසලට වීථි පහනක් සවි කිරීම සුදුසු බවත්,
xiii. මල්මීකන්ද ගල්ලින්නවත්ත මොරිල් මහතාගේ නිවස අසල නාන තොටුපොලට වීථි පහනක් සවි කිරීම සුදුසු බවත්,
xiv. මැටිහක්වල ප්‍රදේශයට ක්‍රීඩා පිටියක් ලබා ගැනීම අවශ්‍ය බවත්,
xv. මල්මීකන්ද තැන්නකුඹුර ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්,
xvi. වාගස්වත්ත සමන්ත. මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ අවදානම් ස්ථාන වලට වීථි පහන් සවි කිරීම සුදුසු බවත්,
xvii. ප්‍රාදේශීය සභාවෙන් ලබා දී ඇති ජල සැපයිම් පාරිභෝගිකයින්ට දිනපතා පාවිච්චියට ප්‍රමාණවත් නොවන නිසා හැකි ඉක්මනින් විසඳුමක් ලබා ගැනීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය

## 5.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

I. ඇවැන්දෙනිය සිට ඌරාවල විද්‍යාල මාවත දෙපස JCB යන්ත්‍රය යොදා එළිකිරීම සුදුසු බවත්,
II. වීථි පහන් සම්බන්ධ දී ඇති යෝජනා සම්බන්ධව නැවත අවධානය යොමු කරන ලෙසත් ,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් යෝජනා කරන ලදුව,එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. කාරක සභා වාර්තා සලකා බැලීම.

## 6.1. 2019. 01.10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 337 සිට 376 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. ප්‍රසම්පාදන වාර්තා සලකා බැලීම.

- **ඩිජිටල් පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරිම (II අදියර)**

වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ කාර්යාල ගොඩනැගිල්ලේ (II අදියර) ඉදි කිරිම සඳහා 2019.01.10 වන දින මෙම කාර්යාලයේ පැවැති ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී තිරණය කර ගත් පරිදි ඊට අදාළ ලියවිලි තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර, එම කමිටුවේ ඇගයීම් වාර්තාව ලැබුණු පසුව නැවතත් 2019.01.31 වෙනි දින ප.ව. 2.30 ට මෙම සභා කාර්යාලයේදි ප්‍රසම්පාදන කමිටුව රැස් විය.

එම අවස්ථාවට පහත සඳහන් අය සහභාගි වුහ.

| අනු අංකය | නම | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | කැළුම් ප්‍රියංකර ජයසිංහ මහතා | සභාපති | වැලිගෙපොල ප්‍රාදේශීය සභාව |
| 04 | රෝහන විජේරත්න මහතා | මන්ත්‍රී | වැලිගෙපොල ප්‍රාදේශීය සභාව |
| 03 | එම්.අයි.එස්. කුරේ මිය | ගණකාධිකාරි | ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල , ඕපනායක |
| 04 | එස්. රත්නාවති මැණිකේ මෙනවිය | ලේකම් | වැලිගෙපොල ප්‍රාදේශීය සභාව |

මෙහිදි ටෙන්ඩර් ඇගයීම් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව ලබා දි ඇත්තේ මෙම කර්මාන්තය සඳහා ඉදිරිපත් කර ඇති ලංසු අතුරින් අවම සාර්ථක ලංසුව ඉදිරිපත් කර ඇත්තේ නාලක කන්ස්ට්‍රක්ෂන් , මොරහැල, බලංගොඩ යන ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු 20,598,057.50 කි. මෙම අගය ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ වටිනාකම හා සැසඳිමේදී 0.55% ක වැඩි විමක් වන අතර , කර්මාන්තය ඉහත සඳහන් ආයතනයට ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ වටිනාකම වන රු 20,484,048.23 ක මුදලට ආයතනයේ කැමැත්ත විමසා පිරිනැමීම සුදුසු බවයි.

ඉහත නිර්දේශ වාර්තාවට අනුව නාලක කන්ස්ට්‍රක්ෂන්, මොරහැල, බලංගොඩ ආයතනයෙන් එම මුදලට කැමැත්ත විමසා ටෙන්ඩරය පිරිනැමිම සුදුසු බව ඒකමතිකව තිරණය කරන ලදි.

- **සභාව සතු වැලිගෙපොල සති පොළ හා මළු ලැල්ල බදු දීම**

වැලිගෙපොල සතිපොල සඳහා එක් ටෙන්ඩර් පතක් පමණක් ලැබී තිබූ අතර එහි මුදල වූයේ රු.13180/=කි. අවම ලන්සුව වූ රු.13170/=ට වඩා එය වැඩි මුදලක් බැවින්, එම ලන්සුව ඉදිරිපත් කල ඩබ්ලිව් ප්‍රියංකා දමයන්ති මහත්මියට ලබා දීමට තීරණය විය.

වැලිගෙපොල මාළු ලැල්ල සඳහා එක් ටෙන්ඩර් පතක් පමණක් ලැබී තිබූ අතර එහි මුදල වූයේ රු.35150/=කි. අවම ලන්සුව වූ රු.35000/=ට වඩා එය වැඩි මුදලක් බැවින්, එම ලන්සුව ඉදිරිපත් කල ඩී.එම්.නිරංජන් පද්ම කුමාර මහතාට ලබා දීමට තීරණය විය.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2018.දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 576,247.51 | වැටුප් හා දීමනා | 2,894,791.63 |
| කුලී | 151,681.26 | ගමන් වියදම් | 58,926.50 |
| බලපත්‍ර ගාස්තු | 107,500.00 | සැපයුම් හා උපකරණ | 791,277.99 |
| සේවා සඳහා ගාස්තු | 133,344.11 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 469,396.25 |
| වරෙන්තු ගාස්තු | 28,856.19 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යාක සේවා | 256,989.23 |
| වෙනත් ආදායම් | 301,952.68 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 383,927.57 |
| වෙනත් ආධාර | 2,201,610.47 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,501,192.22 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 37,426.10 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 4,892,735.27 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 527,960.10 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,501,192.22 | ණය ආපසු ගෙවීම් | 248,502.98 |
| සේවක ණය | 105,162.78 | සේවක ණය | - |
| තැන්පත් | 49,076.20 | තැන්පත් | 212,367.29 |
| අත්තිකාරම් | 38,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 13,000.00 |
| සමුච්චිත අරමුදල | - | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 192,238.98 | සමුච්චිත අරමුදල | 137,641.20 |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 363,008.49 |
| මුළු එකතුව | 3,693,431.20 | මුළු ගෙවීම් | 6,032,206.84 |

## 7.2. 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.11.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **246432** | **5%** | **649426** | **33%** | **1290574** | 4456849 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8107** | **11%** | **5849** | **28%** | **15051** | 63035 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 125000 | | | **130671** | **105%** | **(5671)** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **272400** | **107%** | **(17400)** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **844250** | **116%** | **(114250)** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **45150** | **151%** | **(15150)** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **144543** | **32%** | **313457** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1529453 | **82%** | **4400361** | **72%** | **1674639** | 339488 |
| 9 | විකුණුම් | | 497000 | | | **175393** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **251550** | **24%** | **798450** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | **110549** | **44%** | **139451** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුළී 5.23(2) | 133193 | 428000 | 78135 | **59%** | **150500** | **35%** | **277500** | 55058 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **72827** | **66%** | **37173** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 20880 | **81%** | **222935** | **88%** | **31065** | 5,000.00 |
| 18 | නිවාස කුළී | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **458000** | **115%** | **(58000)** | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **109800** | **37%** | **190200** | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවක ණය පොලී1.64 | | **40000** | | | **47003** | **118%** | **(7003)** | |
| **25** | අයකර ගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **3150** | **13%** | **21850** | |
| **26** | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150%** | **(500)** | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31** ට හිඟ | **2018** වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | **2018.11.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| **27** | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අය කර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **867022** | **87%** | **132978** | |
| **29** | විශේෂ සැපයුම් සදහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළ භූමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **582255** | **66%** | **295885** | |
| | **මුළු එකතුව** | **6791836** | **15179140** | **1898287** | **28%** | **9545433** | **63%** | **5312100** | **4919429** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12. 31** ට හිඟ | **2018** වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | **2018.07.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 8.00 | 5% | 142 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | **කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13** | **5000** | **107000** | **5,000.00** | **1.00** | **42,000** | **39%** | **65000** | - |
| 7 | **සභා භූමිය කුලියට දීම** | | | | | | | | |
| 8 | **පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු** | | | | | | | | |
| 9 | **නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1)** | | **200000** | | | **65000** | **33%** | **135000** | |
| 10 | **පුස්තකාල සේවා ගාස්තු 6.43** | | **15000** | | | **9790** | **65%** | **5210** | |
| 11 | **පුස්තකාල දඩ 6.52** | | **20000** | | | **4197** | **21%** | **15,803** | |
| 12 | **ඉඩම් විකිණීම මත බදු** | | | | | | | | |
| 13 | **ඉඩම් බදු 3.24** | **10279** | **448390** | **10279** | **100 %** | **383860** | **86%** | **64530** | - |
| 14 | **වෙළෙඳ ස්ථාන කුලී03.22** | | **87600** | | | **77400** | **88%** | **10,200.0** | |
| | එකතුව | **15279** | **878140** | **15279** | **100 %** | **582255** | **66%** | **295885** | - |

## 8. <u>පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම</u>

පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව ප්‍රකාශ කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.කේ.ඉසුරුමුණි මැතිතුමා

I. අකරල්ල රංවල සිට අම්බැවිල දක්වා මාර්ගය දැඩිලෙස අඩලන්ව ඇති බැවින් ඒ සඳහා කෙටිකාලීන විසඳුම් නොගෙන කාපට් කර මාර්ගය ස්ථාවර ලෙස සකස් කර දෙන ලෙස මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ප්‍රධාන ලේකම්තුමිය දැනුවත් කරන ලෙසත් ජනතා අරගලයක් ඇති වුවහොත් තමන් ඔවුන්

සමඟ සිටින බවත් ප්‍රකාශ කල අතර,එයට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමාද සහය පල කර සිටි අතර,තාවකාලික විසඳුම් සඳහා කිසිසේත්ම ඉඩ නොදෙන බවත් ප්‍රකාශ කළේය.පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියළු ගරු මන්ත්‍රීතුමන්ලා එම අදහසට සිය එකඟතාව ප්‍රකාශ කළේය.

## 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

- වැලිගෙපොල නව පොලිස් ස්ථානය ඉදිකර ඇති ස්ථානයේ කැළෑවැදී ඇති සංස්කෘතික ගොඩනැගිල ආයුර්වේද රෝහලක් සඳහා සුදුසු බැවින් එය සභාවට පවරාගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.ඒ සඳහා කරුණු එක් කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය ,එම ගොඩනැගිල්ල පිළිසකර කිරීමට සංස්කෘතික අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කර ඇති බවට කරණු අනාවරණය වී ඇති බවත් එම නිසා එම ගොඩනැගිල්ල සභාවට පවරා ගැනීමට නොහැකි වනු ඇතැයි පැවසීය.
- ගරු මන්ත්‍රීතුමා,පොල්ලමුර පාසල ඉදිරිපිට ඇති සුදු ඉර අනතුරු සහිත බැවින් එය ඉවත් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියේය.

## 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

- උඩවෙල ප්‍රාදේශීය රෝහලේ දන්ත වෛද්‍යවරයෙකු නොමැතිවීම හේතුවෙන් අවට ප්‍රදේශ වල ජනතාව දැඩි අසීරුතාවන්ට ලක්වෙන බවටත්,අම්මඩුව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයක් වසා දමා ඇති බවටත් කරණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා ඒ පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියේය.
- කපුගල හන්දියේ කුඩුදවුල ගසකට මැදිවනසේ දුරකථන රැහැන් ඇද ඇති බවත් එය අනාරක්ෂිත බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයත්,මාර්ග සංවර්ධන අධිකාරියත් දැනුවත් කරන ලෙස දන්වා සිටියේය.

## 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

රංවල විද්‍යාලයේ ගුරු පුරප්පාඩු තිබියදී එක් ගුරු මහත්මියක් දින සතියේ දින දෙකක් සඳහා ගල්පාය විද්‍යාලයට අනුයුක්ත කර ඇති අතර ,ඒ හේතුවෙන් පාසල් දෙකෙහිම ළමයින් දැඩි සීරුතාවට ලක්වන බව පෙන්වා දෙන ලදී.මේ තත්වය නතර කර පාසල් දෙකට අවශ්‍ය ගුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ඉල්ලා පළාත් අධ්‍යපන අධ්‍යක්ෂ හා අධ්‍යපන අමාත්‍යාංශ ලේකම් දැණුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.තවද ,අකරල්ල වැල්ල වත්ත ක්‍රීඩා පිටිය මධ්‍යයේ අවහිර වන පරිදි ස්ථාන ගත කර ඇති විදුලි කණු දෙකක් හේතුවෙන් ක්‍රීඩා කටයුතු වලට බාධා ඇතිවන අතර එය ඉවත්කර දෙන ලෙස ඉල්ලා විදුලි අධිකාරී බලවින්න හා විදුලි ඉංජිනේරු ඇඹිලිපිටිය දැණුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

## 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

වැලිගෙපොල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා අවසරයකින් තොරව සහභාගීවීම නීත්‍යානුකූල නොවන බැවින්, සියළු මන්ත්‍රීතුමලාට හා මන්ත්‍රීතුමියන්ලාට සහභාගීවීමට අවස්ථාව ලබා දෙන ලෙස

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් හා සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලෙසත්,කොට්ඨාශ මට්ටමින් රජයේ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මස තුනකට වරක් හෝ කොට්ඨාශ සම්බන්ධීකරණ රැස්වීමක් පැවැත්වීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන ලදී.

### 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් හල්ලින්න මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් ඒ පිළිබඳ ප්‍රධාන ලේකම්තුමිය දැනුවත් කර එය පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලද

### 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් උඩවෙල ප්‍රාථමික විද්‍යාලයට පැමිණීමට සිසුන් විශාල ප්‍රමාණයක් සිටින අතර එක් සමාන්තර ශ්‍රේණියක් පැවතීම ප්‍රමණවත් නොවන බැවින් සමාන්තර ශ්‍රේණි දෙක බැගින් ඇතිකිරීමට කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**සභා රැස්වීමේ නිමාව**

කොට්ඨාශ 10 ආවරණය වන පිරිදිසභාවේ කටයුතු දියත් කිරිමට වැඩ සැලැස්මක් සකස් කර ඇති අතර,එහි ආරම්භය ලෙස රංවල කොට්ඨාශයේ එම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද බවත්,කොට්ඨාශයෙන් කොට්ඨාශයට දින වෙන් කර අදාළ කොට්ඨාශයේ මන්ත්‍රිතුමන්ලා සම්බන්ධ කර ගනිමින් ඔවුන් ලබා දුන් යෝජනා ප්‍රමුඛ කොට ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.එමෙන්ම  මෙම වර්ෂයේදි  බල ප්‍රදේශයේ බස් ධාවන වන මාර්ග පිළිසකර කර දිමට පළාත් මාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පොරොන්දු වු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි. අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පල කරමින් සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කර සභාවේ කටයුතු පස්වරු 12.45ට පමණ නිමාවට පත් කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,

සභාපති,

වැලිගෙපොල ප්‍රාදේශීය  සභාව